# කැලණිය විශ්වවිද්‍යාලය - ඉතිහාසය

කුලතිලක කුමාරසිංහ

ලංකා විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයෙහි අවුරුදු එකසිය තිස් තුනක පරම්පරාවක් කැලණිය විශ්වවිද්‍යාලය සතු වේ. ක්‍රි. ව. 1875 නොවැම්බර් මස 01 වන දින ආරම්භ වූ විද්‍යාලංකාර පිරිවෙන් විද්‍යායතනයේ වර්තමාන විකාශන අවස්ථාව ලෙස සලකනු ලබන්නේ කැලණිය විශ්වවිද්‍යාලයයි. බටහිර විශ්වවිද්‍යාල ආකෘතියට අනුව විද්‍යාලංකාර මහා පිරිවෙන විශ්වවිද්‍යාලයක් බවට පත් වූයේ 1959 දී බව සත්‍යයකි. එහෙත් අපගේ උරුමය සහ ශාස්ත්‍රීය සම්ප්‍රදාය, විද්‍යාලංකාර විද්‍යායතනයේ ආරම්භය කරා ම දිව යයි. මේ අතිවිශිෂ්ට විද්‍යායතනයේ ප්‍රථම පරිවේණාධිපතිවරයාණන් වූයේ පණ්ඩිතාචාර්ය රත්මලානේ ශ්‍රී ධර්මාලෝක මහා ස්වාමීන්ද්‍රයන්වහන්සේ ය. ක්‍රි. ව. 1875 – 1887 දක්වා වූ එහිමියන්ගේ පරිවේණාධිපතිත්වය යටතේ විද්‍යාලංකාර පිරිවෙන විසින් 19 වන සියවසේ අවසාන භාගයේ මෙරට පැවතුණු ශාස්ත්‍ර ප්‍රබෝධයට සුවිසල් මෙහෙයක් ඉටුකරනු ලැබිය. එකල ශාස්ත්‍ර ප්‍රබෝධය දල්වීමට තුඩුදුන් විවිධ වාදවිවාදවල කේන්ද්‍රස්ථානය වූයේ මේ පුණ්‍ය විද්‍යායතනයයි. ඉන්පසු පිළිවෙළින් 1887 - 1918 දක්වා පණ්ඩිත කාර්යශෝම රත්මලානේ ශ්‍රී ධර්මාරාම නාහිමි ද, 1918-1945 දක්වා පණ්ඩිත සිරෝමණි, ලුණුපොකුණේ ශ්‍රී ධර්මානන්ද නාහිමි ද, 1945 – 1959 දක්වා ආගම චක්‍රවර්ති, කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර නාහිමි ද මේ විද්‍යායතනයේ අභිවර්ධනයට ඉමහත් සේවයක් ඉටු කළහ.

1959 ජනවාරි පළමුවන දින අභිනව විශ්වවිද්‍යාලයක් ලෙස නීතිගත වූ විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපකුලපති ස්වාමීන්වහන්සේ බවට පත් වූයේ ද කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර නාහිමියෝ ය. එදා විද්‍යාලංකාර මහා පිරිවෙනට බටහිර ආකෘතියේ විශ්වවිද්‍යාල තත්ත්වය ප්‍රදානය කිරීමට රජය පෙළඹුණේ පරමාර්ථ දෙකක් ඉටුකර ගැනීම සඳහා ය. මූලික අභිප්‍රාය වූයේ සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කිරීමේ පියවර සැබෑ ලෙසින් ම ක්‍රියාත්මක කිරීම ය. ලංකාවේ ජාතික අධ්‍යාපන ක්‍රමයේ පොදු කාර්යය වශයෙන් ජාතික විද්‍යා පීඨ දෙකක් ගොඩනංවා ගැනීම දෙවනි අරමුණ විය.

සමාරම්භක අවධියේ දී විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ ධූරයට පත් වූයේ යක්කඩුවේ ශ්‍රී ප්‍රඥාරාම නාහිමියෝ ය. එකල විශ්වවිද්‍යාලයේ ඉගැන්වීම හා පරිපාලන කටයුතු පවත්වන ලද්දේ පෑලියගොඩ පිරිවෙනට අයත් ගොඩනැගිලිවල ය. අධ්‍යාපන කටයුතු සඳහා සමාරම්භයේ දී අධ්‍යයන පීඨ පහක් පිහිටුවනු ලැබී ය. එනම් භාෂා පීඨය, බෞද්ධ පීඨය, කලා පීඨය, විද්‍යා පීඨය හා දර්ශන හා පර්යේෂණ